ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකः 2477424, 2477423, 2477311
ෆැක්ස්ः 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියः www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2019 සැප්තැම්බර් 17 |

## "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන - 2019" ප්‍රකාශනය නිකුත් කිරීම




ශ්‍රී ලංකා මහ බැංකුවේ, වාර්ෂික ප්‍රකාශනයක් වන "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන - 2019" මහජනතාවගේ පරිශීලනය සඳහා දැන් නිකුත් කර ඇත.

මෙම ප්‍රකාශනයෙහි ජාතික ගිණුම්, කෘෂිකර්මය, කර්මාන්ත, ජාත්‍යන්තර වෙළෙඳාම සහ මූල්‍ය කටයුතු, රාජ්‍ය මූල්‍ය, බැංකු සහ මූල්‍ය ආයතන, මුදල් සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ, මිල හා වැටුප්, ජනගහනය සහ ශ්‍රම බලකාය, ප්‍රවාහනය, අධ්‍යාපනය, සෞඛ්‍ය, විදුලි සංදේශ සේවා සහ දේශගුණය යනාදී ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ තත්ත්වය පිළිබිඹු වන දර්ශක මෙන්ම අනෙකුත් රටවල්වල තෝරාගත් ආර්ථික සහ සමාජ දර්ශක ද ඇතුළත් වේ.

දත්ත භාවිතා කරන්නන්ගේ විවිධ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කාලශ්‍රේණි සහ හරස්කඩ පදනමින් මෙම ප්‍රකාශනයේ දත්ත ඉදිරිපත් කර ඇති අතර, මෙය ව්‍යවසායකයන්ට, ප්‍රතිපත්ති සම්පාදකයන්ට, පර්යේෂකයන්ට, ගුරුවරුන්ට, ශිෂ්‍යයන්ට සහ මහජනතාවට ඉතා ප්‍රයෝජනවත් වනු ඇත.

මෙම ප්‍රකාශනය, සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ලෙහි (චැතැම් වීදිය, කොළඹ 01) හා බැංකු විදු පියෙසෙහි පිහිටි බෙදාහැරීමේ කවුළු වලින් මෙන්ම (අංක 58, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය) සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර, මාතලේ, නුවරඑළිය, කිලිනොච්චිය, ත්‍රිකුණාමලය හා අනුරාධපුර පිහිටි ප්‍රාදේශීය කාර්යාලවල ඇති බෙදාහැරීම් කවුළු වලින් මිල දී ගත හැකිය. තවද මෙහි විද්‍යුත් පිටපත ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් (http://www.cbsl.gov.lk) ලබා ගත හැක.